**ශීර්ෂය 160 පරිසර අමාත්‍යාංශය**

**----------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**-------------------------------**

පරිසර අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 මැයි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ජුනි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යංශයේ කළමනාකරණ සේවයේ නිලධාරියකු විසින් සිදු කර තිබූ වංචාවක් සම්බන්ධයෙන් රු.260,361 ක මුදලක් අයවිය යුතුව තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නොපියවූ අග්‍රිම ශේෂයක් ලෙස එම මුදල ගිණුම්වල දක්වා තිබුණි. | 2020 ඔක්තෝබර් 08 දිනැති විනය නියෝගයට අනුව නිලධාරියා විසින් රජයට මූල්‍ය වංචාවක් සිදුකර ඇති බවට තීරණය කර තිබුණි. එසේ වුවද අදාළ විනය නියෝගයේ සඳහන් දඬුවම නිලධාරියාගේ වැටුප් වර්ධක 03 ක් විලම්බනය කිරීම පමණි. එම විනය නියෝගය මගින් රජයට සිදුවූ අලාභය වන රුපියල් 260,361 ක මුදල රජයට අයකර ගැනීමට හෝ නිලධාරියා විසින් රජයට ගෙවීමක් සිදු කිරීම සඳහා නියෝග ලබා දී නොතිබුණි.අයකර ගැනීම පිළිබඳ උපදෙස් විනය බලධාරින්ගෙන් විමසා ඇත. | අත්තිකාරම් පියවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 891(i) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වාගත යුතු වුවත් අමාත්‍යාංශය විසින් එසේ කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ විගණන හා කළමණාකරණ කමිටු රැස්වීම පැවැත්වීම සහ අභ්‍යන්තර විගණන සැලැස්මක් සකස් කර ඒ අනුව අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබයි. තවද අමාත්‍යාංශයේ ප්‍රගති සමාලෝචන රැස්වීම්, මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම්, පවත්වනු ලබන අතර එම සෑම රැස්වීමකදී ම අභ්‍යන්තර පාලනය නිසි පරිදි සිදු වේද යන්න සාකච්ඡා කරනු ලබයි. මෙම සෑම කටයුත්තම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ සෘජු අධීක්ෂණය යටතේ සිදු වේ.<br>විගණන නිරීක්ෂණය අනුව, අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය හා අභ්‍යන්තර පාලන පද්ධතිය නිසි පරිදි ක්‍රියාත්මක වන බවට විගණනයට වාර්තා කිරීමට කටයුතු කරමි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

-------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ---------------------------------------- | ----------- |
| සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ගොඩනැංවීමේ ව්‍යාපෘතිය හා පාරිසරික සංවේදී භූමි ප්‍රදේශවල ජෛව විවිධත්ව සංරක්ෂණය සහ පරිසර පද්ධති සේවා නඩත්තු ව්‍යාපෘතිය (ESCAMP) සඳහා පිළිවෙලින් වෙන් කර තිබූ රු.2,478,373 ක් හා රු.5,880,165 ක් උපයෝජනය නොකර භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. | සන අපද්‍රව්‍ය බැහැර කිරීමේ ව්‍යාපෘතියේ අවසන් බිල්පත් පියවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම හා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී ඇතිවූ විවිධ දුෂ්කරතා හේතුවෙන් කාර්යයන් නිම කිරීමට නොහැකිවීම හේතුවෙන් ප්‍රතිපාදන නැවත භාණ්ඩාගාරයට යැවීමට සිදුවිය. | භාණ්ඩාගාරයෙන් ලැබෙන මුදල් උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

### 2.2 වියදම් කළමනාකරණය

--------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ---------------------- | ------------------------------------------ | ----------- |
| ප්‍රතිපාදන ඉතිරිවීම් වල මුළු වටිනාකම රු.105,445,677 ක් වූ අතර ඉන් රු.86,690,909 ක් හෙවත් සියයට 82.21 ක්ම මූලධන ප්‍රතිපාදන ඉතිරිවීම් විය. මූලධන වැය විෂයයන් දෙකක ප්‍රතිපාදන සියයට සියයක් ඉතිරිව තිබුණු අතර වැය විෂයයන් 06 ක සියයට 50 ට වැඩියෙන් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | අමාත්‍යාංශය පිහිටි "සොබාදම් පියස" ගොඩනැගිල්ලේ නව වැඩිදියුණු කිරීම් ඇති වේ යැයි අයවැය සකස් කරන අවස්ථාවේදී අපේක්ෂා කල නමුත් 2020 වර්ෂයේ එවැනි අවශ්‍යතා ඇති නොවීම හා 2019 වර්ෂයේ රාජ්‍ය වියදම් කළමණාකරණය යටතේ අයවැය චක්‍රලේඛ අංක 04/2019, 07/2019 මගින් නව මිලදී ගැනීම් සීමා කිරීම 2020 වර්ෂය අවසානය දක්වා වෙනස් නොවීම හේතුවෙන් ඉහත සඳහන් වැය විෂයයෙහි ප්‍රතිපාදන ඉතිරි විය. | ව්‍යාපෘති ක්‍රියාකාරකම් සමාලෝචනය මගින් අවශ්‍යතාවය හඳුනාගෙන ප්‍රතිපාදන සලසා ගැනීමට කටයුතු කල යුතුය. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 104 (1) (අ) | අලාභහානියක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමටත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීම සිදු කල යුතු වුවත් 2020 නොවැම්බර් 16 දින සිදුවූ වාහන අනතුරකට අදාලව විගණිත දිනය වන 2021 අප්‍රේල් 05 වන දින වන විටත් අලාභය ගණනය කර නොතිබුණි. | අංක PF 9438 දරන කැබ් රථය හදිසි අනතුරකට පත්වීම නිසා කැබ් රථය අලුත්වැඩියා කිරීම සඳහා යොමු කර ඇති අතර, අලුත්වැඩියාවට වැය වන මුදල නිශ්චය කර ගැනීම සඳහා හා කැබ් රථයේ රක්ෂණාවරණය මගින් එම වියදම ආවරණය වන්නේද යන්න එම ආයතනය වෙතින් විමසීමක් කර ඇත. මේ වනවිට අදාල අනතුර සඳහා වගකිව යුතු සියලු පාර්ශවයන්ගෙන් ප්‍රකාශ සටහන් කරගෙන අවසන්ව ඇති අතර, එම ආයතන වෙතින් පිළිතුරු ලැබීමෙන් අනතුරුව පරීක්ෂණ වාර්තාව හා මු.රෙ. 104 (4) වාර්තාව ලබා දීමටත් ඒ අනුව අලාභයන් පියවීමටත් කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 104 (1) (4) | හානිය සිදු වූ දිනයේ සිට මාස 03 ක් ඇතුළත පූර්ණ වාර්තාවක් විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් 2021 අප්‍රේල් 05 වන දින වන විටත් අමාත්‍යාංශය සතු වාහන දෙකක් සම්බන්ධයෙන් එලෙස කටයුතු කර නොතිබුණි. | අංක NB 2752 දරන වෑන් රථයේ අනතුර සම්බන්ධයෙන් මු.රෙ 104(3) ප්‍රාරම්භක වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඇති අතර වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් ප්‍රකාශ ලබාගෙන මූලික පරීක්ෂණ වාර්තාව සකස් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| **(ආ)** 2017 දෙසැම්බර් 31 දිනැති අංක 2/2017 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | 2018 ජුනි 30 දිනට පෙර රජයේ සෑම ආයතනයක් විසින්ම භාවිතා කරන රජයට අයත් සෑම වාහනයක්ම එම ආයතනය නමින් ලියාපදිංචි කළ යුතු බව අවධාරණය කර තිබුණද භාහිර ආයතනයන්ට අයත් වාහන 03 ක් අමාත්‍යාංශය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති වාහනය හා වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයට අයත් වාහනය පවරා ගැනීමට කටයුතු කරමින් පවති. නිල රථයක් ලෙස රැගෙන එන ලද මෝටර් රථයේ අයිති ආයතනය සොයාගැනීමට නොහැකි වී ඇත. එහි අයිතිකරු සොයාගෙන පවරා ගැනීමට කටයුතු කරනු ලබන බව දන්වමි. | |

**3. මෙහෙයුම් සමාලෝචනය**
**-----------------------------**

**3.1 සැලැසුම් කිරීම**
**---------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ----------- |
| 2019 වර්ෂයේදී සුහුරු දේශගුණික විපර්යාස නගර ව්‍යාපෘතිය සඳහා සුදුසු සුහුරු නගර තෝරා ගැනීමේදී පරිසර අමාත්‍යාංශය විසින් 2011 වර්ෂයේදී නිකුත් කර තිබූ කාලගුණික විපර්යාස සඳහා වූ අවදානම් දත්ත පොත | පිළිතුර පසුව ඉදිරිපත් කරමි. | ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා යාවත්කාලීන දත්ත පදනම් කර ගනිමින් ව්‍යාපෘති සැලසුම් කල යුතු අතර |

| | | |
|---|---|---|
| (climate change vulnerability data book) භාවිතා කර තිබුණු අතර අන්තර්ගත දත්ත වර්ෂ 08ට වඩා පැරණි බව නිරීක්ෂණය විය. මේ අනුව වඩා සුදුසු සුහුරු නගරය තෝරා ගැනීමේදී යාවත්කාලීන වූ දත්තයන් භාවිතා කර නොතිබුණි. ව්‍යාපෘතිය මගින් තාක්ෂණික සහය ලබාදෙන අතර අනුගත වීම් (Adaptation) හා අවම කිරීම් (Mitigation) වශයෙන් අදියර 02 කින් සමන්විත විය. මේ සඳහා අමාත්‍යාංශය 2020 ජුලි මස වර්ෂයක කාලයකට ගිවිසුම් ගතව තිබුණද එම කටයුතු නිමකර නොතිබුණි. | | නියමිත කාලය තුළ නිමකළ යුතුය. |

**3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශබ්ද දූෂණය පාලනය සම්බන්ධයෙන් දැනට පවතින රෙගුලාසි සංශෝධනය කර නව රෙගුලාසි හඳුන්වාදීමටත්, බහුවිධ වාහන නලා මෙරටට ගෙන්වීම තහනම් කිරීමටත් අවශ්‍ය ක්‍රියාමාර්ග 2021 ජුනි වන විටත් ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල පාර්ශවයන් සමඟ රැස්වීම් කිහිපයක් පරිසර අමාත්‍යාංශයේදී පවත්වන ලදී. ඒ අනුව, පරිසර අධිකාරිය විසින් අදාල රෙගුලාසීන් සංශෝධනය කිරීමටත්, ක්‍රියාත්මක කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට පැවරීමට යෝජනා විය. තවද, මේ වන විට පරිසර අධිකාරිය විසින් අදාල රෙගුලාසීන් සංශෝධනය කරමින් පවතියි. | නව රෙගුලාසි හඳුන්වා දීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. |
| (ආ) දේශගුණික විපර්යාසය මගින් මෙරටට ඇතිවීමට ඇති අහිතකර බලපෑම් අවම කිරීම සඳහා දේශගුණික විපර්යාස බලපෑම් සඳහා අනුහුරුවීමේ ජාතික සැලැස්ම 2016 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා අරමුදල් සපයා ගැනීමට ජාතික අනුවර්තික අරමුදලක් පිහිටුවීම සැලසුම් කර තිබුණි. එසේ වුවද එම අරමුදල පිහිටුවා නොතිබුණි. | පිළිතුර පසුව ඉදිරිපත් කරමි. | සැලසුම් කරන ලද කාලය වර්ෂ 04 කින් ඉක්මවා ඇති බැවින් අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කල යුතුය. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හානිකර ආක්‍රමණශීලි ශාක හා සත්ව විශේෂ මෙරටට පැමිණීම වැලැක්වීම හා එම ශාක හා සතුන් විනාශ කිරීම සඳහා නව පනතක් කෙටුම්පත් කිරීමේ යෝජනාව 2009 වර්ෂයේදී පරිසර හා ස්වාභාවික සම්පත් අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කර තිබුණි. එම යෝජනාව 2009 ජනවාරි 22 දින අමප/09/0047/359/001 මගින් අනුමත කර තිබුණද විගණිත දිනය දක්වා නව පනතක් ස්ථාපිත වී නොතිබුණි. | ආක්‍රමණශීලි ශාබ හා සත්ව විශේෂ මෙරටට ගෙන්වීම වැළැක්වීම හා එම ශාක හා සත්ව විශේෂ විනාශ කිරීමට අදාල වන ආගන්තුක ජීවී විශේෂ විධිවිධාන පිළිබඳ පනත කෙටුම්පත් කර ඇත. එහි සංශෝධන සහිත අවසන් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත අංක 02/08/GAR 122 හා 2019 නොවැම්බර් 08 දිනැතිව යවා ඇත. | පනත ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| කොරියානු ආර්ථික සංවර්ධන සහයෝගිතා අරමුදල ණය ගිවිසුම යටතේ ක්‍රියාත්මක වූ ඝන අපද්‍රව්‍ය බැහැර කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය වෙනුවෙන් විගණිත දිනය වන විට දරා ඇති වියදම රු.මිලියන 466 ක් වූ අතර එම ව්‍යාපෘතිය 2020 ඔක්තෝබර් 31 දින සිට අසාර්ථක වීම හේතුවෙන් අතර මැද නවතා දැමීම සිදුකර තිබුණි. | මෙම ව්‍යාපෘතිය අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව 2020 වර්ෂයේදී නවතා දැමීමට සිදුවී ඇත. මෙම ව්‍යාපෘතියේ රුපියල් මිලියන 460 ක් වියදම් කර ඇත්තේ සැලසුම් සකස් කිරීම, ප්‍රසම්පාදන කටයුතු, දේශීය ආදායම් දෙපාර්තමේන්තුට ගෙවීම්, යෝජිත ව්‍යාපෘති භූමි සකස්කර ගැනීම සහ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙනුවෙන් දරන ලද වියදම් වශයෙනි. සකස් කරන ලද සැලසුම් ප්‍රසම්පාදනය කරන ලද වත්කම් සහ ව්‍යාපෘති භූමි සකස් කර ගැනීම සඳහා දරන ලද වියදම් අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය නොකරමි. | මෙම යටිතල පහසුකම් භාවිතා කරමින් ක්‍රියාත්මක කල හැකි විකල්ප අවශ්‍යතා හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සිදු කල යුතුය. |

**3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මව් කිරිවල ශරීරයට අහිතකර වන "dioxin – like" (DL) ප්‍රමාණයක් අඩංගු වී තිබේද යන්න පරික්ෂා කිරීම සඳහා 2019 අගෝස්තු 07 වන දින මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් සහ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා රු.1,000,000 ක මුදලක් වැය කිරීමට එකඟ වී ඇතත්, 2021 අප්‍රේල් 09 දින වන විට අවස්ථා දෙකකදී රු.600,000 මුදලක් පමණක් වැයකර තිබුණි. | ව්‍යාපෘතියේ ගිවිසුම අනුව ගිවිසුම් අත්සන් කරන අවස්ථාවේදී ගෙවීමට නියමිත රු.300,000 (ගිවිසුම් ගත මුදලින් සියයට 30) හා දෙවන ගෙවීම් සඳහා අදාල කාර්යන් නිමකිරීමෙන් පසු අදාළ මුදල වන රු.300,000 මුදල වශයෙන් රු.600,000 ක් ගෙවන ලද අතර ගිවිසුමට අදාල අනෙකුත් කටයුතු මෙතෙක් ඉටු කර නොමැති බැවින් එම කටයුතු අවසන් වන තෙක් ඉතිරි මුදල් ගෙවීම් කල නොහැක. | වියදම් කරන ලද මුදලේ කාර්ය සාධනය පරික්ෂා කල යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 45 (xv) වගන්තිය හා 34 (3) වගන්තිය ප්‍රකාරව විශ්ව විද්‍යාලය වෙනුවෙන් ගිවිසුම් වලට එළඹීට පාලක සභාවේ අනුමැතිය මත උප කුලපතිවරයාට පමණක් බලය ලබාදී ඇතත්, එම නියමන්ට අනුගත නොවී මෙම ව්‍යාපෘතිය සම්බන්ධ ගිවිසුමට පරිසර අධ්‍යයන මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ විසින් අත්සන් තබා තිබුණි. | මෙය පුවත්පත් දැන්වීමට අනුව පේරාදෙනිය විශ්වවිද්‍යාලයේ පරිසර අධ්‍යයන මධ්‍යස්ථානය විසින් ඍජුව ඉදිරිපත් කරන ලද යෝජනාවක් මත ඇති කරගත් ගිවිසුමක් බැවින් එම ආයතනයේ අධ්‍යක්ෂවරයා සමග ගිවිසුම් අත්සන් කරන ලදී. එම ගිවිසුම සඳහා නීති නිලධාරිනියගේ අනුමැතිය, තාක්ෂණ ඇගයුම් කමිටුවේ අනුමැතිය හා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මෙම ගිවිසුමට අත්සන් තබන ලදී. | ගිවිසුම් ගත වීමේ නෛතික විධි විධාන වලට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2019 දෙසැම්බර් 19 දින පැවැත්වූ 15 වන මෙහෙයුම් කමිටු රැස්වීමේ තීරණය පරිදි (Steering Committee) මව්කිරි සාම්පල් ලබාගත යුත්තේ පැස්සුම් ආයතනවල (Welding plait) | කොවිඩ් 19 ගෝලීය ආපදා තත්ත්වය හේතුවෙන් ජර්මනියෙන් ඇනවුම් කරන ලද භාණ්ඩ නියමිත පරිදි නොලැබීම නිසා ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වන බව පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පරිසර අධ්‍යයන | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී එහි කාර්යසාධන නිර්නායක හඳුනාගැනීම හා එහි ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ හැකියාව |

| | | | |
|---|---|---|---|
| | සේවයේ නියුතු නිලධාරීන්ගේ පවුල්වලින් වන අතර ප්‍රථම දරු උපතින් සති දෙකක් ඇතුලත ලබාගත් මව්කිරි සාම්පල් භාවිතයට ගතයුතු විය. තවද 2020 මාර්තු වන විට නියැදි ලබාගත යුතු බවට දක්වා තිබුණද 2021 අප්‍රේල් 09 දින වන විටත් මේ සම්බන්ධව කටයුතු කර නොතිබුණි. | මධ්‍යස්ථානය විසින් දන්වන අතර එම උපකරණ නොමැති වීම හේතුවෙන් මව්කිරි සාම්පල ලබා ගැනීමට නොහැකි විය. මේ වන විට උපකරණ ලැබී ඇතත් මුලින් අපේක්ෂිත මව්වරුන්ගෙන් සාම්පල ලබා ගත හැකි තත්ත්වයේ නොමැත. නව සාම්පල ලබාගතයුතු මවුවරුන් හඳුනාගත යුතුව ඇත. මෙම ආපදා තත්ත්වය යටතේ මවුවරුන් හඳුනාගැනීම, මෙයට රෝහල්වලින් සාම්පල ලබාගැනීමේ කටයුතු අසීරු තත්ත්වයකට පත්වූ බැවින් මෙතෙක් ඉටු කල නොහැකි විය. | කාලීනව පසුවිපරම් කල යුතුය. |
| (ඉ) | මව්කිරි නියැදි එකතු කිරීමේ සැලැස්ම, රටේ සියලුම ප්‍රදේශ ආවරණය වන පරිදි තෝරාගත් ප්‍රදේශ වලින් නියැදි ලබා ගැනීම, නියැදි සැකසීම, පරීක්ෂා කිරීම සඳහා සාම්පල් චීනයට යැවීම පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් ගිවිසුම අත්සන් කළ අවස්ථාවේ සිට ක්‍රියාත්මක කළ යුතු වේ. මේ අනුව 2020 ජූනි 30 දින වන විට මෙම ව්‍යාපෘතිය අවසන් විය යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2020 දෙසැම්බර් 31 දක්වා ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කර තිබුණද විගණිත දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියා කර නොතිබුණි. | උපකරණ ලබා ගැනීම ප්‍රමාද වීම් හා සාම්පල හඳුනා ගැනීම නැවත සිදුකල යුතුවූ බැවින් හා පවතින කොවිඩ් 19 තත්වය මත ඒ සඳහා සෞඛ්‍ය අංශයෙන් අනුමැතිය ලබා ගැනීම අපහසු වූ බැවින් එම කටයුතු ප්‍රමාද විය. මෙම සාම්පල් ලබා ගැනීමෙන් පසු පරීක්ෂණ කටයුතු සඳහා චීනයට යැවිය යුතුව ඇත. | ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව නැවත සලකා බැලිය යුතු වේ. |

## 3.6 විදේශ ව්‍යාපෘති

-----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>--------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------- | නිර්දේශය<br>----------- |
|---|---|---|---|
| (අ) | දේශගුණික විපර්යාස අවම කිරීමේ හවුල්කාරිත්ව ව්‍යාපෘතිය විසින් 2020 දෙසැම්බර් 29 දින මිලදීගෙන තිබූ පරිගණක 55 න් පරිගණක 38 ක් සැලසුම්ගත ආයතනවලට බෙදා තිබුණද ඉතිරි පරිගණක 17 ව්‍යාපෘතිය තුළම රඳවාගෙන තිබුණි. කෙසේ වුවද ඉහත පරිගණක සඳහා අවශ්‍ය තාක්ෂණික සහයෝගීතාවය නොමැති වීම හේතුවෙන් පරිගණක 55 ම නිෂ්කාර්ය තත්ත්වයේ පැවතුණි. | ඉතා ඉක්මනින් බෙදා හැරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා සිටිමි. | සම්පත් ඵලදායී ලෙස උපයෝජනය සඳහා ඉක්මනින් ක්‍රියාමාර්ග ගැනීම සිදුකළ යුතුය. |
| (ආ) | ව්‍යාපෘතියේ සමස්ත කාර්යසාධනය සියයට 12.45 ක පහළ මට්ටමක පැවතුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය මේ සඳහා බලන ප්‍රධාන හේතුවක් විය. | ව්‍යාපෘති අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

## 3.7 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බව 2019 වර්ෂයේදී ද දක්වා තිබූ අතර 2020 වර්ෂයේදීද එම අඩුපාඩු එසේම පවතින බව නිරීක්ෂණය විය. | දැනට මෙම අමාත්‍යාංශයේ ගබඩාවට අමතර ඉඩකඩ සොයා ගැනීම අපහසු වී ඇත. නමුත් ඉදිරියේදී අමාත්‍යාංශයේ අංශ වෙනස් කිරීමක් සිදුවන විට මේ සඳහා අවශ්‍ය අමතර ඉඩකඩ වෙන් කර ගැනීමට කටයුතු කිරීමට අවධානය යොමු කර ඇත. | සැලසුම් පිළියෙල කල යුතුවේ. |
| (ආ) | පරිගණක උපාංග අයිතම 63 ක් හා ෆැක්ස් යන්ත්‍ර 03ක අතිරික්තයක් පවතින බවට හඳුනාගෙන වාර්තා කර තිබුණි. | පසුගිය වර්ෂවල අමාත්‍යාංශයේ ස්ථාවර වත්කම් ලේඛණ සකස් කර තිබුනද පරිගණක උපාංග වල අනු අංක (Serial Numbers) ද ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛණය ඉන්වෙන්ට්‍රි පොත සමඟ සංසන්දනය කර යාවත්කාලීන කිරීමේදී මෙම අයිතමයන් අතිරික්ත ලෙස හඳුනා ගෙන ඇත. එම අයිතම ඉන්වෙන්ට්‍රි ගත කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | වත්කම් ලේඛන නිසි පරිදි යාවත්කාලීන කර අතිරික්ත වත්කම් උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අනුමත සේවක සංඛ්‍යාව 258 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 229 ක් විය. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 29 ක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 18 ක පුරප්පාඩු වූ අතර එහි ප්‍රතිශතය සියයට 62 ක් වීම හේතුවෙන් එය අමාත්‍යාංශයේ කාර්යසාධනයට සෘජුව බලපාන බව නිරීක්ෂණය විය. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ අනුමත තනතුරු 05 ක් හා 2019 වර්ෂයේ සිට කාර්මික නිලධාරී විදුලි හා ජල හා ගොඩනැගිලි යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. සංවර්ධන නිලධාරි අතිරික්ත සේවක සංඛ්‍යාව 05 ක් විය. | එක් එක් සේවාවන්ට අදාලව අනුමත කරන ලද තනතුරු පුරප්පාඩු 18 ක් පවතින අතර ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ තනතුරු අනුමත කර ගැනීමට අමාත්‍යාංශය ඉල්ලුම් කර නැත. පරිසර අමාත්‍යාංශයේ පෙර කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ සහ වර්තමානයේ අවශ්‍යතාවයක් නොවන කෘෂිකර්ම සේවයේ හා ඉංජිනේරු සේවයේ තනතුරු සඳහා අනුමැතිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලුම් කර ඇත. මෙම අමාත්‍යාංශය සඳහා සංවර්ධන නිලධාරීන් 391 දෙනෙකුගේ අවශ්‍යතාවය පවතී. කාර්මික නිලධාරී (විදුලි) හා කාර්මික නිලධාරී (ජල හා ගොඩනැගිලි) යන තනතුරු සඳහා ඉදිරියේදී සියළු රාජ්‍ය ආයතන වෙනුවෙන් පවත්වන පොදු තරඟ විභාගයකින් බඳවා ගැනීමට නියමිතය. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීම හා කාර්යමණ්ඩලය සංශෝධනය කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |